***2017 ජනවාරි මස 24අඟහරුවාදා දින2017ஜனவரி மாதம் 24 ஆம் திகதி செவ்வாய்க்கிழமைTuesday24th January 2017***

ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ பிரதித்தவிசாளர் –உதயகாந்த குணதிலக அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Dep.ChairmanUdayakanthaGunathilaka preside the Chair

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* ---------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක්, සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා පළමුව. සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා, ඒ වගේම අමාත්‍යතුමන්ලා, අපේ විපක්ෂනායකතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. 2017 ජනවාරි මස 24 වෙනි අද දින සභාවේ කටයුතු කරගෙන යාම සඳහා සියළුදෙනාගේම සහයෝගය අපේක්ෂා කරනවා.

අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් : නැත

ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත

ගරු සභාපතිතුමාගේ නිවේදන :

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* ---------------------------------------------------------

න්‍යාය පත්‍රයේ 14 යටතේ පොදු කටයුතු යටතේ තිබෙන යෝජනාව තිබෙනවා සබරගමුව පළාත් සභා කාර්ය පටිපාටි රීති අංක 66 (1) යටතේ කරනු ලබන ප්‍රකාශයයි. ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත 2017 ජනවාරි 09 වෙනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බවත්, එම පනතේ කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඌ) (5) (ආ) වන ව්‍යස්ථා ප්‍රකාර වන බැවින් පළාත් සභාවල අදහස් ලබා ගැනීම පිණිස එක් එක් පළාත් සභාවලට යොමු කරන ලෙස 46 (ආ) (2) (ආ) වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග යටතේ ගරු කථානායකතුමා විසින් නියෝග කර ඇති බැවින් ඒ අනුව මෙම පනත් කෙටුම්පත පළාත් සභාවට යොමු කරනු ලැබූ දිනය ලෙස සළකනු ලබන 2017 ජනවාරි මස 10 වෙනි දින සිට එක් මසක් ඇතුළත එවන ලෙසත්, එක් මාසයක කාලයක් තුළ ඔබ පළාත් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට නොලැබුණ හොත් පනත් කෙටුම්පත පිළිබඳව ස්ථාවර නියෝග අංක 46 (ආ)(2)(ආ) ප්‍රකාරව ක්‍රියා කිරීමට පියවර ගනු ලබන බවත් දන්වා පාර්ලිමේන්තු මහ ලේකම් විසින් සබරගමුව පළාත් සභාවේ ලේකම් වෙත 2017 ජනවාරි 10 දිනැතිව දන්වා එවා තිබෙනවා. මෙම නිවේදනය සහ පනත් කෙටුම්පතේ පිටපතක් මේ වනවිටත් ඔබතුමන්ලා වෙත ලැබීමට සළස්වා තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබාදීම සහ අනුමැතිය ලබා ගැනීම පළාත් සභාවේ කටයුතු යටතේ

සිදු කරනු ලබනවා. මේ පිළිබඳව සභාවේ අදහස්.....

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ තිරසාර සංවර්ධන පනත පිළිබඳව අපට අධ්‍යයනය කරන්න ප්‍රමාණවත් කාලයක් ලැබුනේ නෑ. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපට මතක විදිහට මෙවැනිම පනතක් මීට කලින් වතාවක අපි සම්මත කළා වගේ මතකයකුත් අපට තියනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපට අධ්‍යයනය කළයුතුයි වගේම කලින් අපට මේක සම්මත කළා නම් නැවතත් මේ වගේ පනතක් එහෙම පැමිණෙන්නේ කුමන කාරණාවක් නිසාද කියන එක පිළිබඳව අපි පරීක්ෂා කර බැලිය යුතුයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා මේ පනත පිළිබඳ සාකච්ඡාව ඊළඟ සභා වාරයට කල් තබමින් මේ සම්බන්ධව ප්‍රඥප්ති කාරක සභාවට මෙය යොමු කරන ලෙස මේ ගරු සභාවෙන් මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*** *கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச* *Hon.OppositionLeader W.Somadasa*---------------------------------------------------------

තිරසාර සංවර්ධනයක් සඳහා පනතක් එවලා තියන එකේදී අපි විපක්ෂයේ අපි මේ වෙනකොට පනත කියවලා බලලා අපි සාකච්ඡාවට සූදානම් වෙලා ඇවිල්ලා තියනවා. ඒ නිසා අපි

සාකච්ඡාවක් කරන්න බලාපොරොත්තුවක් තියනවා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*** *கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.MemberNamindaAnurapriya*-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ රම්‍යකුමාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම ස්ථිර කරමින් ඉදිරිපත් කර සිටිනවා මේක ඊළඟ සභාවට ගන්න. ඒ වගේම ප්‍රඥප්ති කාරක සභාවේ දී ගන්න කියන යෝජනාව මම ස්ථිර කර සිටිනවා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර*** *கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.MemberAjith Kumara*---------------------------------------------------------

කාලය ප්‍රශ්නයක්ද ?

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka* -------------------------------------------------------

කාලය ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. මෙතන අපේ මන්ත්‍රීවරු ප්‍රකාශ කර සිටියේ මේ පිළිබඳව මේ හා සමාන පනතක් මීට කලින් ඉදිරිපත් වෙලා තියනවා. ඒ වගේම නැවතත් මේ පනතක් ඉදිරිපත් කිරීම තුළ ඒ පිළිබඳව අධ්‍යයනය

කරන්න ඕන කියන කාරණාව තමයි අපේ මන්ත්‍රීවරු ප්‍රකාශ කරන්නේ.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර* *கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.MemberAjith Kumara*-----------------------------------------------------------

සභාපතිතුමනි, මේ සභාවට මීට පෙර මෙවැනි පනතක් ඉදිරිපත් කරලා තිබ්බා නම් ඒ පනතත් එක්කයි මේක එවන්න තිබ්බේ, එහෙම නම්. එහෙම එවනවා නම් අපේ සභාවෙන් වියයුත්තේ ඔබතුමාගේ කාර්යාලයෙන්...

(සභාවෙන් බාධා)

*ගරු මන්ත්‍රී අජිත් කුමාර* *கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.MemberAjith Kumara*-----------------------------------------------------------

අපේ සභාවෙන් මීට පෙර පනතක් ඉදිරිපත් කර තිබේ නම් ඒ පනතේ පිටපතකුත් එක්කයි අපට මේක අධ්‍යයනය කරන්න එවන්න තිබ්බේ.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.MemberRamya Kumara Weerasinghe* ------------------------------------------------------

ඒ නිසාමයි අපි මේක අධ්‍යයනය කරන්න කාලයක් ඉල්ලන්නේ.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර* *கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.MemberAjith Kumara*-----------------------------------------------------------

එතුමා මතු කරන ප්‍රශ්නය පිළිබඳ ගැටළුවක් නෙමෙයි මේ කියන්නේ. හැබැයි කථානායකවරයා දැන්වීමෙන් ලිත් මාසයක් ඇතුළත මේක ඉදිරිපත් කරන්න තිබේ නම් එහෙම නම් එතකොට විශේෂ සභාවක් තියාගන්න වෙයි අපේ අනෙක් සභාව එනකොට කාලය ඉක්මවා යනවා නම්.

*ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස්* *கௌரவ உறுப்பினர்பிரபாத் மஹேஷ த அல்விஸ்* *Hon.MemberPrabathMahesha de Alwis* ----------------------------------------

මාස කීපයකට උඩදී සම්මත කරලා ඇරියානේ. ඔබතුමාත් හිටියානේ මේ සභාවේ. ඇයි මේ ආයේ එන්නේ ?

*ගරු මන්ත්‍රී අජිත් කුමාර* *கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.MemberAjith Kumara*-----------------------------------------------------------

මම කියන්නේ එවැනි පනතක් සම්මත කරලා තිබ්බා නම් මේ සභාව විසින් අපට ඒකත් එක්කම එවන්න තිබ්බේ. ඔය කියන වචනයට මම විරුද්ධව නෙමෙයි මේ කතා කරන්නේ. හැබැයි ඒ වගේම අපට තියනවා මේකේ කාල සීමාවක් දීලා. ඒ කාල සීමාව ඇතුළත නොවුනොත් මේක පළාත් සභාව නොවිමසා කරන්න පුළුවන්

පරිසර එක අපට ඩිවෝල් සබ්ජෙක්ට් එකක් නෙමෙයි හින්දා. එතකොට අපට තියන අයිතියක්, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියක් අපි අහෝසි කර ගැනීමක් වෙනවා. පළාත් සභා බලයක් නෙමෙයි මේක. ඉතින් ඒ නිසා සමහරවිට අපේ අදහස් විමසුවේ නැත්නම් මේක පාර්ලිමේන්තුවට ඕන නම් සම්මත කර ගැනීමක් පුළුවන් කරගන්න. එතකොට ඒක අපට තියන අයිතියක් නැති කර ගැනීමක්.

*ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ* *கௌரவ நிலந்த ஜயசிங்க*
*Hon Member NilanthaJayasighe* ----------------------------------------------------------------------------------------------------

පනත් දෙකම මේ ලිපියක් එක්ක ලැබෙන්න සළස්වලා තියනවා. මේ තියෙන්නේ.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* ---------------------------------------------------------

මන්ත්‍රීතුමා, ප්‍රශ්නය තියෙන්නේ දැන් නව පනතක් එවලා තියනවා. කෙටුම්පතක්. එතකොට මේකේ ගැටළුව තියෙන්නේ දැන් පහුගිය පනතත් එක්ක සංසන්දනය කරනකොට ඒ පහුගිය පනතේ තිබෙන අඩුපාඩු හෝ සංශෝධන තියෙන්න ඕන. එතකොට සංශෝධන කිසිවක් මේකේ නෑ. එතකොට එකම ආකාරයේ පනත් දෙකක් අපි සම්මත කිරීම පිළිබඳව මන්ත්‍රීවරු කියනවා මේ පිළිබඳව අපට අධ්‍යයනයක් කරන්න ඕන මොකක්ද මේ එකම විදිහේ පනත් දෙකක් සංශෝධනත් නැතුව ඉදිරිපත් කරන්නේ ඇයි කියන

කාරණාව. අන්න ඒ නිසා තමයි එතුමන්ලා ඉල්ලන්නේ කාලයක් අවශ්‍යයි කියලා.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අජිත් කුමාර මැද්දේගම මන්ත්‍රීතුමා කියන්නේ , එතුමා කියන කථාව බොහොම පැහැදිලියි. එතුමා වරදක් නෙමෙයි කියන්නේ. එතුමා කියන්නේ ලිත් මාසයක් තුළ මේක සම්මත නොකළොත් ඒගොල්ලෝ මේක අපි සම්මත කළා සේ සළකා කටයුතු කරන්න පුළුවන්. සම්මත කරයි කියන එක කියන්නේ. එහෙම ප්‍රශ්නයක් තියනවා නම් අපි පෙබරවාරි 14 ට කලින්, පෙබරවාරි 14 තියන්න තියන රැස්වීම ඊට කලින් සතියට පවත්වන්න අපි මේ සභාව විදිහට තීරණය කරමු.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* ---------------------------------------------------------

එහෙම නම් හරි අපි න්‍යාය පත්‍රානුකූලව...

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.OppositionLeader W.Somadasa*---
---------------------------------------------------------

ඊළඟ සභාවට මේ යෝජනාව ගන්නවාද ?

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* ---------------------------------------------------------

ඊළඟ සභාවට ගන්න එක තමයි කරන්න වෙන්නේ. මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අනුව. කාලය අවශ්‍ය වුනොත් අපි විශේෂ සභාවක් තියලා හරි ක්‍රියාත්මක කරමු, අපි සාකච්ඡා කරලා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.OppositionLeader W.Somadasa*---
---------------------------------------------------------

කාලය මදි නම් විශේෂ සභාවක් කරලා ගන්න බැරිද මේක සාකච්ඡාවට. අපි යෝජනාය කරනවා කාලය මදි නම් ඒක සාකච්ඡා කරලා යවන්න, විශේෂ සභාවක් කැඳවලා මේ සාකච්ඡාව ගන්න කියලා විපක්ෂය විදිහට යෝජනා කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* ---------------------------------------------------------

හොඳයි. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා.

නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු ආණ්ඩු පක්ෂ සංවිධායක හර්ෂ සියඹලාපිටිය මැතිතුමා.
ගරු මන්ත්‍රී ආනන්ද මිල්ලන්ගොඩ මැතිතුමා.
ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල මැතිතුමා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* ---------------------------------------------------------

නම් සඳහන් ගරු මැති ඇමතිතුමන්ලා සඳහා නිවාඩු අනුමත කරනවා.

ලිපි ලේඛණ පිළිගැන්වීම :

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය கௌரவ நமிந்த அனுரபிரிய Hon.MemberNamindaAnurapriya-------*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, ආර්.ඒ.පියදාස, ප්‍රශක්ති, පිටකන්ද, බුළුතොට යන අයගේ පෙත්සම සභාගතකර සිටිනවා.

කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත.

පෙත්සම් : නැත

ප්‍රශ්න :

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.ChairmanUdayakanthaGunathilaka* ----------------------------------------- ----------------

ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් මැතිතුමාගේ ප්‍රශ්නයට මේ වනවිට පිළිතුරු ලැබිලා තියනවා.

ඒ වගේම ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් මැතිතුමාගේ දෙවෙනි ප්‍රශ්නයට මේ වනවිට පිළිතුරු ලැබිලා තියනවා.

අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :

*ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස් கௌரவ உறுப்பினர்பிரபாத் மஹேஷ த அல்விஸ்Hon.MemberPrabathMahesha de Alwis*
---------------------------------------

ගරු සභාපතිතුමනි, මට ඔබතුමාගේ අවසරයක් දෙනවා නම් අමාත්‍යවරයා වශයෙන් ප්‍රකාශනයක් කරන්න කැමතියි. ගරු සභාපතිතුමනි, පසුගිය සභාවේ දී මම ඔබතුමාගේ ගරු පළාත් සභාවේ දී ප්‍රකාශයක් කළා, අ.පො.ස. සාමාන්‍ය පෙළ 2016 ප්‍රතිඵල සම්බන්ධයෙන් සියළුම තොරතුරුවල වාර්තාවක් ගරු පළාත් සභාවට ඉදිරිපත් කරනවා කියලා. ඒ අනුව 2016 වසරේ අ.පො.ස. උසස් පෙළ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පළාත් 9 ක ශිෂ්‍යයෝ ලංකාවේ ලිව්වා. ඒ අතරින් ලංකාවේ සියයක් ඒ විභාගයට අසුන් ගන්නකොට ඒකෙන් 66.58 ක්, 67 දෙනෙක් පමණ ප්‍රමාණයක් සබරගමුව පළාතේ ශිෂ්‍යයෝ විශ්ව විද්‍යාල ප්‍රවේශය සමත් වෙලා තියනවා. ඒක තමයි ලංකාවේ අංක 1. එමනිසා සබරගමුව පළාත අ.පො.ස.උසස් පෙළ විශ්ව විද්‍යාල ප්‍රවේශය සමත් වූවන්ගේ ප්‍රතිශතය අනුව අනෙක් පළාත් අටම පරාජය කරලා පළවෙනි ස්ථානයට පැමිණියා කියන සතුටුදායක ආරංචිය මම ඔබතුමන්ලා වෙත කියන්නට අවශ්‍යයි. ඒ වගේම දිස්ත්‍රික් 25 න් හොඳම දිස්ත්‍රික්කය ගත්තාම රත්නපුර දිස්ත්‍රික්කය ලංකාවේ පළවෙනි වතාවට ඒක 68.48 යි. ලංකාවේම ගත්තාම ලංකාවේම ප්‍රතිශතය 63.36% ක් තිබිය දී තමයි මේ ස්ථානයට සබරගමුව පළාතේ අධ්‍යාපනය ලබපු දරුවෝ ඇවිල්ලා තියෙන්නේ. ඊට වඩා තියනවා ගරු සභාපතිතුමනි, කලා විෂයය ධාරාවේ ලංකාවේම වැඩියෙන්ම සමත්

දරුවෝ ඉන්නේ සබරගමුව පළාතේ. වාණිජ විෂයය ධාරාව ලංකාවේ වැඩියෙන්ම සමත් දරුවෝ ඉන්නේ සබරගමුවේ. තාක්ෂණ විද්‍යාවේ විෂයය

ධාරාවේ වැඩිම සමත් දරුවෝ ඉන්නෙත් සබරගමුවේ. අපට නැත්තේ ගණිතය සහ විද්‍යාව විෂයය ධාරාවන් විතරයි. එමනිසා අපට තියෙන්නේ ගණිතය සහ විද්‍යාව විෂයය ධාරාවන් අ.පො.ස. උසස් පෙළ ඉහළට ගෙන ඒමට. ඒ ඒකකම ජෛව විද්‍යා විෂයය ධාරාව උසස් පෙළ ලංකාවේ ප්‍රථමයාත් වුනේ අපේ මහ ඇමතිතුමා විසින් රුපියල් ලක්ෂයක පරිත්‍යාගයක් කළා ඒ දියණියට. ඒ පළාත් සභාවක පාසලක දියණියක් වූ කෑගල්ලේ අපේ ශිෂ්‍යාවක්. අපි පසුගිය අවුරුදු 4 යි මාස 3 ඇතුළත කාලයේ ජාතික පාසල්වල ගුරුවරු ගෙනල්ලා අපේ පාසල් ඇතුළේම පුහුණුවට ලක් කළා. අපේ ගුරුවරුන්ට පුහුණුව දුන්නා. එතකොට මම දැක්කා පසුගිය අවස්ථාවක බලන්ගොඩ කලාපයේ තමයි ශිෂ්‍යයත්වය වැඩිම සමත් දරුවෝ ප්‍රමාණය හිටියේ. 5 ශිෂ්‍යත්වය පසුගිය අවස්ථාවේ ප්‍රතිඵල ආපුවම පළාත් අටම පරද්දලා වැඩියෙන්ම සමත් වීමේ 5 ශිෂ්‍යත්වය මේ අවුරුද්දෙත් ජයග්‍රහණය කළේ සබරගමුව පළාත. අ.පො.ස. උසස් පෙළ තියෙන්නේ තුන්වෙනි ස්ථානයේ පළවෙනි වතාවට මේ අවුරුද්දේ ප්‍රතිඵලවලින් අපි බලපොරොත්තු වෙනවා ලංකාවේ දෙවෙනි ස්ථානයට එයි කියලා. ඉතින් සමහරු මේක පසුගිය කාලයේ මේක විග්‍රහ කරන්න ගත්තා විවිධ විදිහට. මේ පළාත් අමාත්‍යාංශයේ ජයග්‍රහණයක් නෙමෙයි. පළාතේ අධ්‍යාපන අංශයේ ජයග්‍රහණයක් නෙමෙයි. එක්කෝ පුද්ගලික පන්තිවල ජයග්‍රහණයක්. එහෙමත් නැත්නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ ජයග්‍රහණයක්. එහෙම කියලා. නමුත් මම ඉතාම වගකීමෙන්, උවමනාවෙන් කියනවා මේ ජයග්‍රහණය පිටිපස්සේ සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය කෙලින්ම හිටියා. ඒ අයට විශාල අඩිතාලම් මම හිතන්නේ අපට මහීපාල හේරත් මැතිතුමා දාලා තිබුණා. විශාල ගුරුවරු සංඛ්‍යාවක් පහුගිය අවුරුදු හතර තිස්සේ ගත්තා. 6300 ක් උපාධිධාරීන්. ඒ අය වැඩියෙන්ම දැම්මේ උසස් අධ්‍යාපනයට.

ඉතින් ඒක යටතේ මේකට කැප වෙච්ච අපේ ප්‍රධාන ඇමතිතුමාට ස්තූතිවන්ත වෙමින්, මේකේ සියළු සංකල්පනා හැදුවාට පස්සේ ක්‍රියාත්මක කිරීම කරපු අපේ අධ්‍යාපන ලේකම්තුමා නියම කළාට පස්සේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමා පළාතේ, ඒ වගේම විදුහල්පතිවරු, ඒකට කැප වෙච්ච ගුරුවරු සහ ජයග්‍රහණය ලබාගත්ත ඒ සියළුදෙනාටම ස්තූතිවන්ත වෙමින්, ජයග්‍රහණය ලබපු සියළුම පළාතේ සබරගමුවේ දරුවන්ට සුභාශිංසනය කරමින්, මම මතක් කරන්න කැමතියි ලෝකය ජයගන්නට මේ දරුවන්ට සබරගමුවේ මේ ජයග්‍රහණවලින් ලැබේවා කියලා මම ඉතසිතින් පතනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.ChairmanUdayakanthaGunathilaka*** ---------------------------------------------------------

බොහොම ස්තූතියි ! ගරු ඇමතිතුමාට.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்லHon.Opposition Whip SiripalaKiriella***
---------------------------------------------------

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙනවාද ?

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.ChairmanUdayakanthaGunathilaka*** --------------------------------------------------------

ලිපිය සභාගත කරන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*** கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*Hon.Opposition Whip SiripalaKiriella*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමනි, ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය කියලා කිව්වාම ඒ විද්‍යාලයටම අවේනික ළමයි 42 ක් ඉන්නවා. තවත් පන්තියකට. මේ පිටස්තර ළමයි නෙමෙයි අපි කියන්නේ. ධර්මපාල ප්‍රාථමික විද්‍යාලයේ 42 ක් ඉන්නේ ඒ පාසලටම ආවේනික ළමයි. එහෙම නම් අපි පන්ති 8 තිබුණ එක 7 කිරීමක් කරලා තියනවා. පළමුව පන්ති 10 ක් තිබුණ එක තමයි 6 කළේ. පස්සේ 7 කරලා 8 ත් තළා. දැන් ආපහු 7 වෙලා තියනවා. නැවත අපි ඉල්ලනවා මේ දෙමව්පියන්ගේ ඉල්ලීම. මොකද පිටස්තර ළමයි නෙමෙයි මම වගකීමෙන් කියනවා. පාසලට ආවේනික ළමයි 42 ක් ඉන්න නිසා කරුණාකරලා තිබුණ පන්තිය නැවතත් වැඩි කරලා 8 ක් බවට පත් කරන්න කියලා මම ඉල්ලනවා ගරු සභාපතිතුමනි. අපේ අධ්‍යාපන ඇමතිතුමාට මම මේ ලියුම භාරදෙනවා. බොහොම ස්තුතියි ! ඔබතුමා කාලය දුන්නාට.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார் *Hon.MemberM.Y.M.Iflar*
---------------------------------------

ගරු සභාපතිතුමනි, මට ලැබුණ පිළිතුරක් සම්බන්ධයෙන් තිබෙන ගැටළුවක් තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා මාර්ග අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමාගෙන් උත්තරය ලැබිලා තියනවා. නමුත් මම මේකෙන් කියලා නෑ,කාපට් කියලා. මේකේ ගැහුවාට මෙන්න මෙහෙම එකක් තියෙන්නේ ගරු සභාපතිතුමනි. ඉහත සඳහන් මාර්ගයේ කොටසක් කහවත්ත, ගලතුර මාර්ගයේ මීටර් 450 ක නඩත්තු කිරීම් වලට අයත් වේ. එම මාර්ගය කාපට් කිරීම සිදු නොකළ අතර, එහෙම මාර්ගය කාපට් කිරීමක් සිදුකර නෑ. කාපට් එකත් එක්ක අතුරු මාර්ගය. ඒකේ වාර්තාව එන්න ඕන, මේකේ යට තියනවා ප්‍රශ්නය එහෙමම තියනවා. ගලතුර දක්වා ඇති ප්‍රදේශය තාර දැමීම අවිධිමත්ම සිදු කරන බව එම ප්‍රදේශවාසීන් විසින් දන්වා සිටී කියන එක. ඒකෙදී ගරු සභාපතිතුමනි, මේකේ කියනවා කලවාන විධායක ඉංජිනේරු අධීක්ෂණය යටතේ අදාළ කොන්ත්‍රාත්තුව විධිමත් පරිදි නඩත්තු කර නොමැති බව දන්වා සිටිනවා. නමුත් කොහොම වුනත් මම නැවත ඉල්ලීමක් කරනවා නැවත මේ පිළිබඳව සොයා බලන්න කියලා. නැවත මේ වෙනකොට ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක් තියනවා නිසි ක්‍රමවේදයට එම කාර්යය ඉෂ්ඨ වෙලා නෑ කියලා. ඒ පිළිබඳව සොයා බලලා වාර්තාවක් සභාගත කරන්න කියලා, මොකද මේ දීපු වාර්තාවට වඩා මෙම මාර්ගය නිසි ප්‍රමිතියට සිදුවෙලා නෑ කියන

පැමිණිල්ල ප්‍රදේශවාසීන් විසින් දැනුම් දෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා නැවත ගරු ඇමතිතුමාව දැනුවත් කරන්න කියලා, මේක නැවත ඒ

වාර්තාව දෙනවාට වඩා අදාළ ස්ථානීය පරීක්ෂණයක් කරලා අපට ලබාදෙන්න කියලා මේක නිසි විදිහට නිසි ප්‍රමිතියට කාර්යය ඉෂ්ඨ වෙලාද කියලා බලන්න.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ* *அமைச்சர் அதுல குமார ராஹுபத்த* *Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, උගත්, වගකීමක් ඇති මන්ත්‍රීවරයෙක් ඉෆ්ලාර් මන්ත්‍රීතුමා. පිළිතුර පිළිබඳව සතුටු වෙනවා වගේම එතුමාට ලැබුණ කාරණාව අනුව තමයි එතුමා කතා කරන්නේ. මේ මාර්ගය කාපට් මාර්ගයක්. ඒකේ තියනවා මීටර් 450 ක් කොන්ක්‍රීට්. ඔබතුමාට දීපු ඒවානේ. මේ මම ගියපු ඒවා කථා කරන්නේ. කවුරු හරි දීපු දෙයක් නෙමෙයි මම උත්තර දෙන්නේ. මම උත්තර දෙන්නේ වගකීමෙන්.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* *கௌரவ* *உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.MemberM.Y.M.Iflar*

----------------------------------------

මම ගියා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ* *அமைச்சர் அதுல குமார ராஹுபத்த* *Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

ඔබතුමා ගියා. වළවල් කීයක් තියනවාද? ඔබතුමා ගිහිල්ලා නෑ. ඔබතුමා ඊයේ පෙරෙයිදා ගියත් වළවල් දෙකයි. එකක් බැකෝ එක වැදිලා පොඩ්ඩක් කැඩිලා තිබුණා. ඒක ඊයේ හදලා තිබුණා. වතුර උල්පතක් එනවා මැදකින්. ඒක විතරයි තියෙන්නේ. ඒකට අවශ්‍ය කරන පිළියම හොයනවා. පොඩි එකක් තියෙන්නේ. වෙන කිසිම දෙයක් නෑ. මීටර් 450 ක දුරක් තියනවා කොන්ක්‍රීට් එකක් දාලා. ඒ කොන්ක්‍රීට් එක පුපුරලා තියෙන්නේ. ඒකට පිළියමක් විදිහට තමයි මේකේ කාපට් කරන්න කියලා තියනවා මිලියන 7 ක්. ඒ කියන්නේ ලක්ෂ 70 ක් වෙනවා ඔය දුර ප්‍රමාණයට. ලක්ෂ 16 කින් කාපට් කළා වගේ හදලා තියනවා. ඒකනේ කාපට් කළා කියලා තියෙන්නේ විධිමත් නොවන විදිහට. ඒ කියන්නේ ලක්ෂ 16 කින් අපි කාපට් එකට වඩා හොඳට ඒ වැඩේ කරලා තියනවා. ඒ නිසා මම බොහොම වගකීමෙන් කියනවා මේ පිළිතුර භාර නොගන්නවා නම් මම ඔබතුමාට මගේ වාහනයේ යන්න ආරාධනා කරනවා. අදාළ ඉංජිනේරුතුමා සහතිකය දීලා තියනවා, ඉතාම හොඳට ප්‍රමිතියට කරලා තියනවා කියලා. අර කාරණා දෙක විතරයි තියෙන්නේ. බැකෝ එකක් වැදිලා ඒකේ පුංචි වළක් හැදිලා තියනවා. දිය බුබුළක් ඇවිල්ලා තියනවා. ඒක ඊයේ හදලා තියනවා. දිය බුබුළ එක ගැන මට කියන්න බෑ. මොකද ඒක මේ වැහි දවස්වලට මතුවෙන හින්දා. පාරේ වෙන කිසිම දෙයක් නෑ. ඒ නිසා මේ ලක්ෂ 16, ලක්ෂ 70 ක් වියදම් කරලා කරන්න තිබ්බ වැඩේ මීටර්

450 ඇතුළේ දැනට තියන ක්‍රමය තමයි. එච්චර මුදලක් වියදම් කරලා කඩලා කොන්ක්‍රීට් එකක් ඉවත් කරනවා වෙනුවට

ලක්ෂ 16 ක පෙරමුසු දාලා මේක කාපට් වගේ හදලා දීලා තියනවා. ඉතාම හොඳට, කාපට් කළා වගේ කියන්නේ ඒකට. ඒ නිසා ඒකේ ගිහිල්ලා තියන මුදල ලක්ෂ 16 යි.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip SiripalaKiriella*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, පයින්වත් යන්න බැරුව තිබුනේ හෙමින්ෆෝඩ් පාර. කාපට් කරන්න බැරි වුනා. ඒ උඩ තමුන්නාන්සේ සානුකම්පිතව හිදලා බලලා කිලෝ මීටර් දෙකක් තාර දමා දීම සම්බන්ධයෙන් තමුන්නාන්සේට අපේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා. ඒ එක්කම 2017 ඒ පාර කාපට් කරන බවත් ප්‍රකාශ කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.MemberRamya Kumara Weerasinghe* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි, කලින් කථා කරපු මාර්ගය පිළිබඳව මට වචනයක් කියන්න ඕන. මම ගරු ඇමතිතුමාට ඉස්සෙල්ලා කියන්න හැදුවේ, මොකද මේක සභාවෙත් මේක යොමු කරලා තියනවා දැකපුවාම. මම ගියා මේ පාර බලන්න. මේ පාර බලන්න ගිහාම අර ඇමතිතුමා කියපු විදිහටම කැඩිලා ගිය කොන්ක්‍රීට් එකක් අතර මැද තියන කොන්ක්‍රීට් එක අළුත් තාක්ෂණය භාවිතා

කරලා, අඩු වියදමකින් ඉතාම සාර්ථක විදිහට කලවාන විධායක ඉංජිනේරුතුමා විසින් සාර්ථකව කාපට් මාර්ගයක් හා සමානව හරිගස්සලා තියනවා. මම එතුමාට කථා කරලා ඇහුවා මොකක්ද මේ වෙලා තියෙන්නේ ? කියලා. එතුමාත් මේ කාරණාව පැහැදිලිව කිව්වා, මේකයි වෙලා තියෙන්නේ කියලා. ඒ නිසා මේ මහා පරිමාණ දූෂණ, වංචා, හොරකම් වෙන ආණ්ඩුවක මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා සල්ලි ඉතිරි කරපු එකක් පිළිබඳව විමසීමකින් තොරව මෙවැනි ප්‍රශ්න මේ ගරු සභාවට ගෙන ඒම පිළිබඳව අපේ දැඩි විරෝධය මේ අවස්ථාවේ පළ කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.ChairmanUdayakanthaGunathilaka* -----------------------------------------------------

බොහොම ස්තුතියි ! ගරු මන්ත්‍රීතුමනි.

පෞද්ගලික ප්‍රකාශ :

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.ChairmanUdayakanthaGunathilaka* -----------------------------------------------------

ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට අවස්ථාව. ඊළඟට මම මේ පිළිබඳව කාර්යය පරිපාටි රීති උල්ලංඝණය නොවන පරිදි කථා කරන ලෙස ඉල්ලා සිටිනවා.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* கௌரவ நமிந்த அனுரபிரிய
*Hon.MemberNamindaAnurapriya-------*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මම පසුගිය සභා වාරයේ දී පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට මම මේ ගරු සභාවට ඉදිරිපත් කළ මරුකන්ද විදුලි බලාගාරය වහාම තහනම් කරන්න. මේක තුළින් විශාල පරිසර හානියක් සිද්ධ වෙනවා. ඒ වගේම පරිසර හානියක් සිදුකරලා තිබෙනවා. ඒ වගේම මේක පරිසර අමාත්‍යාංශයේ ඊ.අයි.ආර්. රිපෝට් එකක් අරගෙනත් නෑ. ප්‍රාදේශීය ලේකම්වරයා මේක බලලත් නෑ කියලා මම පහුගිය සභාවේ දී යෝජනාවක් ඉදිරිපත් කළා. ඒකෙදී මේ සභාවේ දී ඒකමතිකව යෝජනාව සම්මත වුනා. ඒ අනුව ගරු සභාපතිතුමනි, ඊයේ දිනයේ දී පවත්වනු ලැබූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී තීන්දුවක් අරගෙන තිබෙනවා මේ මරුකන්ද විදුලි බලාගාරය වහාම තාවකාලිකව නවත්වන හැටියට. හැබැයි ගරු සභාපතිතුමනි, එම තීන්දුව ලබාදීම පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමන්ලා දෙපළ වන අපේ ජෝන් සෙනෙවිරත්න මැතිතුමාටත්, අපේ විජේතුංග පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාටත් මම මේ අවස්ථාවේ දී ස්තුතිවන්ත වෙනවා මේක නතර කිරීම පිළිබඳව. ඒ වෙලාවේ දී අපේ සිරිපාල කිරිඇල්ල මැතිතුමා එහෙම මැදිහත් වෙලා තියනවා ගරු සභාපතිතුමනි. ඒ වගේම මම ඉල්ලා සිටින්නේ ගරු සභාපතිතුමනි, දැන් ඊයේ මේ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීන්දුව ගත්තා. හැබැයි අද දිනයේ තවම මරුකන්ද විදුලි බලාගාරය වැඩ. එතකොට ඒ ස්ථානයේ ප්‍රාදේශීය ලේකම්වරයා හිටියා. මේ ප්‍රාදේශීය ලේකම්වරයා මෙච්චර

කාලයකට මෙතෙන්ට ගිහිල්ලත් නැතුව තමයි එයා සාමාන්‍ය ජනතාවගේ ඉඩම් මේ කොම්පැනියට දුන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, වහාම ක්‍රියාත්මක වෙන පරිදි අපි ඉල්ලා සිටිනවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ මේක තාවකාලිකව නැවැත්වුවා වුනත් මේක ස්ථිරසාරවම මේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නතර කරලා දාන්න කියන යෝජනාව තමයි අපි කරන්නේ. ඉතින් ඒ නිසා ඊයෙත් තාවකාලිකව තහනමක් ගත්තු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අපි ඉල්ලීමක් කළයුතුයි ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පරිසර ඇමතිතුමා හැටියට එතුමාගේ අවධානයට යොමු කරලා මෙය තාවකාලිකව නැවැත්වුවේ මේ සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් අනුව ගත්තු ක්‍රියා මාර්ගයක් හැටියට මේක ඉදිරියට ගිහිල්ලා මේ පිළිබඳව විමසලා බලලා ගත්තු තීන්දුවක්. ඒ අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීන්දුවත් මේක ස්ථිර වශයෙන්ම මේ මරුකන්ද විදුලි බලාගාරය සහමුලින්ම නතර කරලා දාන්න කියන යෝජනාවත්, ඒ වගේම ඊයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගත්තු තීන්දුව දිස්ත්‍රික් ලේකම්තුමිය සභාවේ ඉන්නැද්දී එතුමිය විසින් නියෝග කරපු අවස්ථාවේ අදාළ ප්‍රාදේශීය ලේකම්තුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ඉන්නකොටත් තවදුරටත් ඒ නියෝගය ක්‍රියාත්මක වෙලා නෑ. තාක්ෂණය ඉතාම දියුණුයි. දුරකථන තියනවා. ඒ වගේම ඊ මේල් තියනවා. මෙතුමාට ඇයි බැරි මේක ඉතාම ඉක්මණින් නතර කරන්න. මේක ගරු සභාපතිතුමනි, අපට ගැටළුවක් තියනවා. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අදම මේ

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මෙම මරුකන්ද විදුලි බලාගාරය වහාම නතර කරලා දමන ලෙසත්, ඒ වගේම ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේක තාවකාලිකව ගත්තු තීන්දුව ස්ථිර වශයෙන්ම මේ සමනල කන්ද අඩවියෙන්

ගලා බසින සීතගඟුලේ ජල දහරාව මේ අනාගත පරපුරට ඉතිරි කරන්න කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මේ අවස්ථාවේ දී මම කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip SiripalaKiriella*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේක ඇවිල්ලා අපි පළාත් සභාවේ ගෙනාපු යෝජනාව අනුව තාවකාලිකව නැවැත්වුවා නෙමෙයි. ඊයේ විශාල ප්‍රයත්නයක් දරලා තමයි මේ වැඩේ නතර කරගන්න කටයුතු කළේ. ගරු සභාපතිතුමනි, මම කියන්නේ හොරාගේ අම්මාගෙන් පේන අහන්නා වගේ වැඩක් මේක. අපි පළාත් සභාවේ කථා කරන දේවල් තුට්ටුකටවත් ගණන් ගන්නේ නෑ. ඊයෙත් සම්බන්ධීකරණ කමිටුවේ දී යුද්ධයක් කරලා මේකට වෙලාව ගත්තේ. මේක තහනම් කරන්න කිව්වාට ශත 5 කට ගණන් ගත්තෙ නෑ. ඒ වෙලාවේ මගේ තිබුණ උත්සාහයට මේක තහනම් කරනවා කියලා වචනේ ගත්තේ. තහනම් කරනවා කිව්වාට නාමිකව අපට වැඩක් නෑ. තහනම් කරනවා කිව්වාට ඊයෙත් වැඩ කළා. අදත් උදේ වැඩ. මොකක්ද මේ සම්බන්ධීකරණ කමිටුවත් තුට්ටුවට දාලානේ. හැල්ලුවට ලක් කරනවානේ. මේක වැරැද්දක්. දැන් ඔබතුමා කරුණාකරලා, ඔබතුමාට නියෝග කරනවා නෙමෙයි. ඔබතුමාට තියෙන්නේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අපේ

ලේකම්තුමිය, දිස්ත්‍රික් ලේකම්තුමියට ඔබතුමා කියන්න මේක වහාම නවත්වන්න කියලා. ඊයේ නියෝගයක් කළා නම් සම්බන්ධීකරණ කමිටුවේ, ඒ සම්බන්ධීකරණ කමිටුවේ තීන්දුව තුට්ටුවකට ගණන් නොගන්න එකක් තමයි සභාපතිතුමනි, දැන් අද වැඩ කරනවා

කියන්නේ. මේ ප්‍රශ්නය සුළුවෙන් හිතන්න එපා. මේ ප්‍රශ්නය උඩ ජීවිත ගණනාවක් නැති වෙන්න ඉඩ තියනවා. ඒ නිසා මේ ගරු සභාවේ සභාපතිතුමාගේ වගකීම දිස්ත්‍රික් ලේකම්තුමියට කියන්න මේක වහාම නවත්වන්න කියලා. අදම නවත්වන්න කියන්න. නැත්නම් මෙතන විශාල ආරවුලක් ඇති වෙනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.MemberM.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව මම ස්ථිර කරනවා. මොකද යෝජනාවක් වුනා විතරක් මදි, ඒක ක්‍රියාත්මක කරලා, ඒක දැනුවත් කරලා අතිගරු ජනාධිපතිතුමාට, ඒ වගේම දිස්ත්‍රික් ලේකම්තුමියට, ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කරලා කඩිනමින් මේ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න. නැත්නම් මේක ඇද ඇද යයි. කථා කර කර ඉදියි. අපිත් මේ සභාවේ කතා කරයි. අරගොල්ලන් එහේ වැඩේ කෙරෙයි. අපේ තිබෙන ස්වභාවික සම්පත් සහ අපේ පරිසරය විනාශ වෙයි. අන්තිමට කවුරු හරි මුදල් ගනියි. අපේ ප්‍රදේශයට විශාල හානිදායක සිද්ධියක් සිදුවෙයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා කඩිනමින් අද දිනයේ දී මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා මාර්ගයක් අරගෙන අපේ

ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාවට සහනයක් සළසා දෙන්න කියලා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගෞරව***

***பி.தவிசாளர் உதயகாந்த குணதிலக***

*Hon.D.ChairmanUdayakanthaGunathilaka ---------------------------------------------------------*

සභාවේ ඉල්ලීම කඩිනමින් දිස්ත්‍රික් ලේකම් ඇතුළු ඒ අදාළ අංශවලට යවන්න මේ අවස්ථාවේ නියෝග කරනවා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න ගෞරව***

***உறுப்பினர் சலித கருணாரத்ன***

*Hon.MemberSalithaKarunaratne ---------------------------------------------------*

ගරු සභාපතිතුනි, පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ අපේ ප්‍රසාදය හා කෘතවේදීත්වය පළ කරන්න අවසර දෙන්න මේ ගරු සභාව මා නියෝජනය කළාට පස්සේ මගේ පළමු යෝජනාව වුනේ ඇහැළියගොඩ දිස්ත්‍රික් රෝහල මූලික රෝහලක් කරලා දෙන්න කියන යෝජනාව. ඒ වෙලාවේ දී පළාත් සභාවේ විශේෂයෙන් ඇහැළියගොඩ ආසනය නියෝජනය කරන සියළු මැති ඇමතිතුමන්ලා ලොකු උදව් කරලා, කථා බහ කරලා ඒ තීරණයට ආවා. නමුත් වසර ගණනාවක් තිස්සේ මේක ඇදි ඇදී ගියා. අපි ජනාධිපතිතුමා රත්නපුරේට ආපු වෙලාවෙත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලත් කෑ ගහලා මේක කරලා දෙන්න කියලා කිව්වා. කොහොම නමුත් මේක යථාර්ථයක් බවට පත් වුනේ නෑ. රෝහල පැත්තෙනුත් ඉතා සුභවාදීව මේකට උදව් ලැබුනේ නෑ. හැබැයි පසුකාලීනව ඇහැළියගොඩ රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිළධාරී හැටියට ශාන්ත අබේවික්‍රම මැතිතුමා පත්වෙලා ආවා. එතුමා මහා මහන්සියක් අරගෙන, ව්‍යාපාරික ප්‍රජාව එහෙම සම්බන්ධ කරගෙන යටිතල

පහසුකම් දියුණු කිරීමේ උත්සාහයක යෙදුනා. මේ අතරතුර තමයි අපේ ගරු ප්‍රධාන ඇමතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ භාරගත්තේ. ඒකත් එක්ක අපි බලාපොරොත්තු නොවුන මට්ටමේ දැවැන්ත මුදල් කන්දරාවක් ඇහැළියගොඩ රෝහලට ලැබිලා, බලාගෙන ඉන්නැද්දී ඇහැළියගොඩ රෝහලේ යටිතල පහසුකම් ටික දවසින් දවස දියුණු වුනා. ඒකත් එක්ක පහුගිය දවසක වත්මන් සෞඛ්‍ය ඇමතිතුමා වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා 2016.11.30 වෙනිදා ඇහැළියගොඩ රෝහලට පැමිණියා ගරු ප්‍රධාන ඇමතිතුමාගේ ආරාධනාවත් එක්ක. ඒ ඇවිල්ලා එදා ප්‍රකාශයට පත් කළා ඇහැළියගොඩ රෝහල මූලික රෝහල් කිරීමේ නිවේදනය නිකුත් කරන්න කියලා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාට නියෝග කළා. අද මම බොහොම සතුටින් මේ වෙනුවෙන් කැප වෙච්ච එක් පැත්තකින් රෝහලේ කාර්යය මණ්ඩලය, ප්‍රධාන වෛද්‍ය නිළධාරී ශාන්ත අබේවික්‍රම මැතිතුමා ඇතුළු ඒ පැත්තේ අයටත්, විශේෂයෙන් පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විදිහට අපේ ගරු ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අමාත්‍යාංශය භාර සියළු අයටත්, ඒ එක්කම රේඛීය අමාත්‍යාංශයේ වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාටත් අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා 2017.01.02 පොදු චක්‍රලේඛය යටතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ චක්‍රලේඛය ඇවිල්ලා තියනවා ඇහැළියගොඩ රෝහල මූලික රෝහලක් කිරීමේ නිවේදනය. මේක ඉතාම සතුටින් ප්‍රකාශයට පත් කරන ගමන්,

ඒ වෙනුවෙන් කැප වෙච්ච සියළුම දෙනාට අපගේ ගෞරවය හා කෘතවේදීත්වය පළ කරන්න කැමතියි . බොහොම ස්තූතියි !

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka* --------------------------------------------------------

බොහොම ස්තූතියි ! සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාට.

ශෝක ප්‍රකාශ යෝජනා : නැත

පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන ප්‍රකාශ : නැත

පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය ප්‍රකාශ : නැත

පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka* --------------------------------------------------------

සභානායක අසෝක ජයවර්ධන මැතිතුමාගේ යෝජනාව.

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා. கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன* *Hon.Gov.WhipAsoka Jayawardane* ---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අද දින මා විසින් යෝජනා කිරීමට නියමිත මෙම යෝජනාව ලබන සභා වාරය තෙක් කල් තබන ලෙස මම යෝජනා කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka* --------------------------------------------------------

එසේ නම් රංජිත් පොල්ගම්පල මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* Hon.MemberM.Y.M.Iflar ----------------------------------------

න්‍යාය පත්‍රයේ අංක 14 ගත්තේ නෑ. ඒක ඊට ඉස්සෙල්ලා තියනවා

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගෞரவ***
***பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.ChairmanUdayakanthaGunathilaka* -------------------------------------------------------

ඒක අපි සභාවේ කලින් සාකච්ඡා කරලා කල් තිබ්බ නිසා තමයි ඒක ගත්තේ නැත්තේ. පොල්ගම්පල මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල ගෞரவ***
***உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல***
*Hon.MemberRanjithPollgampola*----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම වර්ෂයේ පවතින බවට කාලගුණ අංශ මඟින් අනාවැකි පළකර ඇති දැඩි නියං සමයේ දී ජන ජීවිතවලට ඇති විය හැකි ප්‍රබල බලපෑම්වලින් ජන ජීවිතය රැක ගැනීම අරමුණින් සබරගමුව පළාත් සභාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජලාශයක් බැගින් ඉදිකිරීමට මා යෝජනා කරමි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හදීසි අවස්ථාවක දී ජලය රැස්කර තබා අවශ්‍ය ස්ථානවලට ජලය සැපයීම සිදු කිරීමට පහසුකම් සහිත ස්ථානයක් සැළසුම් කර නිර්මාණය කළයුතු බවට ද, නියං සමය අවසානයේ දී ජලාශ කෘෂිකාර්මික කටයුතුවලට ප්‍රයෝජනයට ගැනීමට හැකි වනු ඇත. ඉදිරියේ දී ඇතිවිය හැකි බවට අනතුරු හඟවා ඇති මෙම නියං සමයේ දී ජන ජීවිතවලට අනතුරුදායක තත්ත්වයක් ඇති නොවන පරිදි මනා ජල කළමනාකරණ වැඩ සටහනක් ක්‍රියාත්මක කර සබරගමුව පළාත් සභාව අනෙකුත් පළාත් සභාවලට ආදර්ශයක් වන අයුරින් කටයුතු කිරීමට මෙම යෝජනාව ඉදිරිපත් කරමි.

ගරු සභාපතිතුමනි, මේ දිනවල පවතින නියං කාලය නිසා මා යෝජනා කරන්නේ අපේ සබරගමුව පළාත් සභාවේ සෑම ආසනයකම, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම එක් වැවක්, සාමාන්‍ය වැවක් වගේ ඉදිකරලා මේ වැසි ජලය රැස්කර ගත්තොත් මම හිතන්නේ අපේ ඉදිරියේ දී නියගයක් ආවොත් ඒකෙන් ප්‍රයෝජනය ගන්න පුළුවන්. ඒ නිසා මේ වැඩ සටහන ගැන අපේ සියළුම ඇති ඇමතිවරුන්ගේ අවධානය යොමු කරලා මේ කාර්යය කළොත් අපට ඉදිරියේ දී අපට විශාල ජල හිඟයකට විසඳුම් ලබාගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන් මතක් කරන්න ඕන අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමා ගිය අවුරුද්දේ ලබාදුන්නා දුෂ්කර වසමකට ලබාදුන්නා මුදල්. ඉතින් ඒක මම හිතන්නේ ඉතාම වටිනා වැඩ සටහනක් වුනා. ඒ එක්කම එතුමාගේ අමාත්‍යාංශයෙන් හරි අපේ ප්‍රධාන ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් හරි යම් වැවක් හදලා මේ කාර්යය කරලා දුන්නොත් අපේ ප්‍රදේශවල ජනතාවට විශාල සහනයක් වෙයි කියන ඉල්ලීම කරමින් මේ සියළුම මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට මේ සියළුදෙනාටම මේ කාර්යය ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මේ සඳහා සහයෝගයක් ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ස්තුතියි !

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගෙளரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*------------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු පොල්ගම්පොල මන්ත්‍රීතුමාට.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.MemberRamya Kumara Weerasinghe* --------------------------------------------------------

ගරු සභාපතිතුමනි සමාවෙලා මට විනාඩියක් දෙන්න. වැඩි වෙලාවක් ඉල්ලන්නේ නෑ.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගෙளரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*--------------------------------------------------------------------------------------------------

න්‍යාය පත්‍රය කරගෙන යන්න තියෙනවා. නමුත් ඔබතුමාට අවස්ථාව දෙනවා.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.MemberRamya Kumara Weerasinghe* --------------------------------------------------------

නෑ මම පොඩි වචන දෙකයි කියන්නේ. ප්‍රධාන ඇමතිතුමනි මට අවසර දෙන්න. ගරු සභාපතිතුමනි මේ යෝජනාව ඉදිරිපත් නොකර මේ නියගය ආපු වෙලාවේ ජනතාවට අවශ්‍ය සියළුම සහන ටික ලබාදීපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් දැන් වැස්ස ලබා දීපු දෙවියන් වහන්සේටත් ස්තූති කරලා මේක ඉල්ලා අස් කර ගත්තා නම් මීට වැඩිය වටිනවා. බොහොම ස්තූතියි.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்Hon.Chief Minister MahipalaHerath*-----------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ රංජිත් පොල්ගම්පොල ගරු මන්ත්‍රීතුමා මං හිතන්නේ මේ දවස්ල විදේශගත වෙලාද කොහේද ඇවිල්ලා තියෙන්නේ. මොකද ගරු සභාපතිතුමනි මේක දැනට මාසයක පමණ ඉඳලා චක්‍ර ලේඛණයක් මගින්ම සියළුම ආයතන වලට පළාත් පාලන ආයතන වලට අපි යවලා අපි පෞද්ගලිකවත් සෑම පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්ට කියලා තියෙන එක බවුසරය හෝ අවශ්‍ය ගම් වලට දැන් යවමින් පවතිනවා. ඒ නිසා මේක නිසියාකාරයෙන් අදාල නිළධාරීන් මේ කටයුත්ත කරනවා. අපි ස්තූතිවන්ත වෙනවා ගරු සභාපතිතුමනි මෙවන් අවස්ථාවක ආපදා අවස්ථාවක මේ නිළධාරීන් අපගේ ඉල්ලීමත් ප්‍රදේශයේ ජනතාවගේත් අවශ්‍යතාවය තේරුම් අරගෙන වැඩ කරන නිළධාරීන් පිරිසක් මේ පළාත් පාලන ආයතනවල ඉන්නවා. ඒ අයට අපගේ ගෞරවය ස්තූතිය මේ අවස්ථාවේදී පුද කරනවා. මේ කාර්යය දැන් සිදු වෙමින් පවතිනවා. දැන් ඒ එක්කම වර්ෂාපතනය අද ඇද හැලෙනවා.

ඒත් අවශ්‍ය ගම්මාන වලට වතුර ඕනේ නම් වතුර තියෙනවා. මොකක් හරි විශේෂ ගමක් තියෙනවා නම් රංජිත් පොල්ගම්පොල ගරු මන්ත්‍රීතුමා අර මගේ ළඟට ඇවිත් ඒක එක කියනවා වගේ කියන්න. එතකොට මම ඒක කරලා දෙන්නම්.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.ChairmanUdayakanthaGunathilaka*------------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. මේ සම්බන්ධව මටත් අදහසක් තියෙනවා ප්‍රකාශ කරන්න ප්‍රශ්නය තියෙන්නේ පහුගිය මෙවර නියඟය තිබ්බ වෙලාවේ නෙමෙයි පහුගිය නියඟය තිබුණ වෙලාවේ ප්‍රධාන ඇමතිතුමාට අපි කාරක සභාවේදී පෙන්වලා දුන්නා. ඒ පෙන්වලා දීම අනුව ඒ වෙන කොට පළාත් පාලන ආයතනයකින් බවුසරයකට රු.8000/- ක් අය කළා වතුරත් එක්ක. ඊට පස්සේ වතුර නැති නම් වතුර නැතිව බවුසරය විතරක් ගන්නවා නම් රු.2000/- ක් ගෙන්න තිබුණා. නමුත් ඒ සියල්ලක්ම කපා හැරලා නොමිලයේ ඒ බවුසර් ලබා දෙන්නත් ඒවගේම ජල සම්පත් මණ්ඩලයෙන් වතුර ගන්නවා නම් ඒ අවශ්‍ය මුදල පළාත් පාලන ආයතන වලින් ගෙවන්නත් ඒ අවශ්‍ය අනුමැතිය ප්‍රධාන ඇමතිතුමා ඒ කොමසාරිස්තුමිය ඇතුළු ඒ නිළධාරීන්ට ලබා දුන්නා ඒ පිළිබඳව මම සතුටු වෙනවා. ඒවගේම මෙවර නියඟය වෙලාවේත් නැවත වතාවක් තිබ්බ චක්‍ර ලේඛණයට අමතරව නැවත වතාවක් චක්‍රලේඛණ නිකුත් කරලා ප්‍රධාන ඇමතිතුමා මැදිහත් වෙලා කොමසාරිස්තුමියට උපදෙස් දීලා ඒ කටයුත්ත කළා පළාත් පාලන වලට. ඒ පිළිබඳව මම සතුටු වෙනවා. ඒවගේම වතුර ගැනීම පිළිබඳ බොහෝ තැන්වල ප්‍රශ්නයක් තියෙනවා. දැන් අපේ ආසනය ගත්තහම වරකාපොල ජල සම්පත් මණ්ඩලයේ ජලය නෑ. ඒවගේම රඹුක්කන නෑ. ඒවගේම බොහෝ තැන්වල ජල සම්පත් මණ්ඩලයෙන් ලබා ගන්න නෑ. මම දවසකට බවුසර් තුනක් ලීටර් 10500 ක් මාක්ස් ආයතනයෙන් වතුර අරන් බෙදනවා. ඒක කරන්න පුළුවන්කම ලැබුණේ පළාත් පාලන ආයතන විසින් ගරු මහ ඇමතිතුමා ගත්තු තීන්දුව නිසා කියන එක මේ අවස්ථාවේදී මතක් කරමින් ඒ පිළිබඳව මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස* கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச *Hon.OppositionLeader W.Somadasa*-----------------------------------------------------------

ගරු සභාපතිතුමා අපිටත් මේක සාකච්ඡා කරන්න ඕනේ. මොකද එතුමාගේ යෝජනාවේ තවත් පැත්තක් තියෙනවා. ඒ පැත්ත ගැන අපි කතා කරන්නේ.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*Hon.Opposition Whip SiripalaKiriella*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි පළමුවෙන්ම අපි මේ සම්බන්ධව ගරු ප්‍රධාන

ඇමතිතුමාට ගෞරවනීය ස්තූතිය. මොකද කුරුවිට ,ඇහැලියගොඩ,රත්නපුර දිස්ත්‍රික්කය සබරගමු පළාත ගත්තහම මේ කාර්යයන් සම්බන්ධයෙන් ඉතාම ඉක්මනින් මැදිහත්වීම ගැන ගරු ප්‍රධාන ඇමතිතුමාට මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. ඒවගේම ගරු සභාපතිතුමනි කාලගුණ ආයතනයෙන් දීලා තියෙන නියෝගය අනුව අපිට මේක වැස්සා වැස්ස දැන් නියඟය ඉවරයි කියලා හිතන්න බෑ ගරු සභාපතිතුමනි. මොකද මාර්තු ,අප්‍රේල්, මැයි වෙනකන් මේ නියඟය පවතින බවට තමයි අපිට දැනුම්දීලා තියෙන්නේ. ඒ නිසා කොයි මොහොතේ

මේ හිරි පොද නවතීද නැවත නියඟය උඩු දුවයිද කියන එක අපිට කියන්නට බැහැ. ඒ නිසා අපි මේකට ලක ලැස්තිවීම ඉතාම වැදගත් වෙනවා. කොහොමත් ඊට කලින් ගරු ප්‍රධාන ඇමතිතුමා මේ ගැන සොයලා බලලා පළාත් පාලන ආයතන , ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීරුවෙන් තියලා මේකට මුහුණු දෙන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු රංජිත් පොල්ගම්පොල මන්ත්‍රීතුමාගේ යෝජනාව එතුමා කාලගුණ ආයතනයෙන් දීලා තියෙන නියෝගය එතුමන්ලා කියලා තියෙන්නේ මැයි මාසය වෙනකන් මේ නියඟය අල්ලනවා කියලා. ඒ උඩ ගත්ත යෝජනාවක් බව මම ප්‍රකාශ කරනවා. අපේ පොල්ගම්පොල මන්ත්‍රීතුමාගේ යෝජනාව මම ස්ථිර කරමින් මම නිහඬ වෙනවා ගරු සභාපතිතුමනි.

*ගරු මන්ත්‍රී උපුල් ශ්‍යාමල් බණ්ඩාර கௌரவ உறுப்பினர் உபுல் ஷாமல் பண்டார Hon.MemberUpulShyamalBandara*

---------------------------------------

ගරු රංජිත් පොල්ගම්පොල මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් මම කතා කරන්නේ. මෙතුමාගේ මේ යෝජනාව මේ නියන් තත්ත්වයට ලඝු කොට දාපුයෝජනාවක් නෙමෙයි. වර්තමානයේ තියෙන පාරිසරික හානියත් එක්ක එන්න එන්නම කැළෑ එළි කිරීමත් එක්ක ... එහෙම නම් ඔබතුමා කතා කරන්න මම නිහඬ වෙන්නම්. කැළෑ එළි කිරීමත් එක්ක ඉදිරි අනාගතයේදී ඉදිරි පරපුරට දැඩි නියන් තත්ත්වයට මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඒවගේම මේ වර්ෂාව මං හිතන්නේ නෑ ලොකු ජලාශ පිරෙන්න තරම් ලොකු වර්ෂාවක් කියලා. ඒවගේම අපි දකිනවා කුඹුරු අක්කර සිය දහස් ගාණක් මේ වෙන කොට විනාශ

වෙලා තියෙනවා. ඒවගේම මේ වෙන කොට පෙර පැවතිච්චි වැව් අමුණු විනාශ වෙලා ගිහිල්ලා තියෙනවා. ඒ නිසා මෙතුමාගේ යෝජනාව මේ නියන් කාලයට විතරක් නෙමෙයි මේක ඉදිරියේදී ඇති විය හැකි තත්ත්වයක් බලලා අපි කියන්නේ නෑ එක පාර අර වැව් දස ලක්ෂයක් හදනවා වගේ වැව් දහසක් හදනවා වගේ හදන්න කියලා. අපි එකින්නෙක පටන් ගෙන ...

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத் Hon.Chief Minister MahipalaHerath*

-------------------------------------------

ගරු සභාපතිතුමනි මම රංජිත් පොල්ගම්පොල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට පිළිතුරක් ලබා දුන්නා. ඒක පිළි නොගන්නේ නම් මේ වාදය කරගෙන යන්න මට ප්‍රශ්නයක් නෑ. මොකද අපි මේ ගරු සභාව වැදගත් යෝජනා වලට සවන් දීලා ජනතාව වෙනුවෙන් කළ යුතු කාර්යයක් අපි ඉෂ්ඨ

කළා. දැන් මේ කාර්යය සිද්ධ වෙනවා. අපිට තියෙන්නේ බවුසරයයි දෙකයි. ඒ තියෙන එවා හැම එකක්ම ක්‍රියාත්මක කරලා තියෙනවා. ඒක ඔබතුමා දන්නේ නැද්ද කියලා මම දන්නේ නෑ. දන්නේ නැත්නම් ඒක තමයි මම ප්‍රකාශ කළේ. මේවා ක්‍රියාත්මක වෙනවා කියලා. ඒක තේරුම් ගන්න ඕනේ. මට මීට වඩා කරන්න දෙයක් නෑ. එහෙම නම් බවුසර් ටිකක් රජයෙන් අරන් දෙන්න තව. එතකොට අපි දාන්නම්. මේක රජය බෙදනවා සල්ලි දීලා. අපි බෙදනවා නිකන්. මේක ගරු සභාපතිතුමනි ක්‍රියාත්මක වෙනවා. රංජිත් පොල්ගම්පොල ගරු මන්ත්‍රීතුමා මේක ප්‍රසිද්ධ වෙන්න ඕනේ නම් මේක දැම්මට කමක් නෑ.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල** கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல*
*Hon.MemberRanjithPollgampola---------------------------------------------------------*

ගරු සභාපතිතුමනි සමාවෙන්න මගේ යෝජනාවේ තියෙන්නේ වැවක් එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට වැවක් හදලා දෙන්න කියලා ඉල්ලීමක්. මම මේ ඔබතුමා කියපු එකට ව්‍යාපෘතියට නෙමෙයි මම යෝජනා කරලා තියෙන්නේ. මම යෝජනා කරලා තියෙන්නේ....

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්** கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்Hon.Chief Minister MahipalaHerath-------------------------------------------*

මන්ත්‍රීතුමනි ඔබතුමා මේ යෝජනාව ප්‍රායෝගිකව ගන්න ප්‍රදේශය සම්බන්ධයෙන්. මේ සියළු දේවල් සිදු නොවෙනවා නම් පමණයි මෙවැනි ප්‍රශ්න ගේන්න ඕනේ. මේක දැනට අපි ක්‍රියාත්මක කරනවා. ඔබතුමා මට කීයක් කියලා තියෙනවද අහවල් තැනට බවුසරය අරින්න කියලා. මම කී තැනකට ඇරලා තියෙනවද. ග්‍රාමීය මට්ටමේ දැරණියගල ආසනයට. මෙතුමා මොකක් හරි ඉල්ලුවොත් මම නොදී ඉන්නවද. ඉතිං ඒවගේ අපි මේක චක්‍ර ලේඛණයක් මගින් පමණක් නෙමෙයි සියළු ලේකම්වරු මේ සභාවට ගෙනල්ලා දැනුවත් කරලා මෙහි තියෙන වැදගත්කම සහ ජනතාව අද පත් වෙලා ඉන්න අසීරු තත්ත්වය තේරුම් කරලා විශේෂ රැස්වීමක් තියලා අපි දැනට මාසයක ඉඳලා මේ කාර්යය ගරු මන්ත්‍රීතුමනි කරනවා. ඉතිං පුදුමයි ඔබතුමා මාත් එක්ක මෙච්චර මිත්‍රයෙක් වෙලා ඉඳලත් මේක දැන ගෙන ඉන්නේ නැති එකට. ඔබතුමා කිච්චට මධ්‍යස්ථාන වලට ගෙනියන්න බෑ. මේක රජයේ ආයතනයක සතු සම්පතක්. ඒ නිසා මේක ස්ථිර තැනක් තියෙනවා ඒවා මුරකරුවන් ආරක්ෂකයන් දාලා අපි ආරක්ෂා කරනවා. තැන් තැන් වලට ගිහිල්ලා මේවා නඩත්තු කරන්න තරම් වත්කමක් මේ පළාත් පාලන ආයතන තුළ නෑ ගරු සභාපතිතුමනි. ඒ තියෙන ක්‍රමය වඩාත් ප්‍රමාණවත් නොවන්නේ නම් ඔබතුමන්ලා ප්‍රතිපාදන දෙන්න අපි ඒක කරන්නම්.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල** கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல*
*Hon.MemberRanjithPollgampola---------------------------------------------------------*

ගරු රංජිත් බණ්ඩාර මැතිතුමනි මගේ යෝජනාව තියෙන්නේ ගරු මහ

ඇමතිතුමනි සමාවෙන්න මගේ යෝජනාව තියෙන්නේ..

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*** *கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்Hon.Chief Minister MahipalaHerath*-------------------------------------------

ඔබතුමාගේ යෝජනාව හොඳයි ප්‍රශ්නය තියෙන්නේ අපිට පුළුවන් ශක්තියෙන් අපි කරන්නේ. අපිට වැව් හදන්න බෑ. අපිට වැව් හදන්න තියා තියෙන ටික නඩත්තු කරන්නවත් සල්ලි නැතුව ඉන්නේ. දැන් අපිට තමුන්නාන්සේලා භාණ්ඩාගාරයෙන් මේ වෙන කොට එවලා තියෙන්නේ ගරු සභාපතිතුමනි 32% යි ගිය අවුරුද්දේ

මුදල්. මට මේ ටික විස්තරාත්මකව කියන්න වෙනවා තමුන්නාන්සේට. මම නොකියනේ ඉන්නේ. මුදල් අමාත්‍යවරයා හැටියට. එතකොට හොඳ නම් කියන්නම් මම ඉතුරු ටිකත්. ඒ නිසා කරුණාකරලා මේක හරියට අවබෝධයෙන් කටයුතු කරන ගරු සභාවක් ලෙසනේ අපි යන්නේ. ඒක තේරුම් අරගෙන කටයුතු කරන්න. ඔබතුමා ප්‍රසිද්ධ වෙන්න මේ යෝජනා දාන්න එපා. ක්‍රියාත්මක කරන්න පුළුවන් ප්‍රායෝගික තත්ත්තවය එන යෝජනා මේ ගරු සභාවට ගෙන එයි කියලා ඉතා වැදගත් ගරු මන්ත්‍රීවරයෙක් හැටියට හිතන නිසයි මම මේ කියන්නේ. මේක කරන්න බෑ.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பிதவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*------------------------------------------------------------------------------------

ගරු පොල්ගම්පොල මන්ත්‍රීතුමා.... විපක්ෂනායකතුමා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*** *கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.OppositionLeader W.Somadasa*---------------------------------------------------------

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගත්ත පියවර ගැන අපි අගය කරනවා. මේ වෙන කොට එතුමා විසින් සම්පූර්ණම කෑගලු දිස්ත්‍රික්කයේ නියඟයට උර දෙන්න පුළුවන් වතුර හිඟ ප්‍රදේශ වලට කළ යුතු යුතුකම් ටික කෙරෙනවා. නමුත් අපේ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනල්ලා තියෙන්නේ ඉදිරි අනාගතය බලලා. මේක අපිට කරන්න බැරි නම් මහ ආණ්ඩුවට හරි යෝජනා

කරන්න ඕනේ. එතෙන්ට ගේන තැනකට ගේන්න ඕනේ. මොකද මම හිතුවේ මේ වහින කාලයට ඇළ දොළවල්වල වතුර ගලාගෙන අපතේ යනවා. නියන් කාලයක් දකින කොටම එක පාරට හිඟයක් තියෙනවා. අද කෑගලු දිස්ත්‍රික්කයේත් රත්නපුර දිස්ත්‍රික්කයේත් එවැනි දෙයක් වෙන්න පුළුවන්. අද ජලය කියන වැහලා මාසයක් යන කොට ඒ ප්‍රදේශ වලට හිඟයක් තියෙනවා. මේක පළාත් සභාවෙන් ජලය දෙන එක හරි. මෙතුමා විශාල මුදල් අය කරන බවුසර් වලට නොමිලේ වතුර දෙන්න කියලා මෙතුමා නියෝග කරලා තියෙනවා. ජනතාවට සේවය වෙනවා. එතන නෙමෙයි මේ කතා කරන්නේ. මේ අපතේ යන ජලය රැක ගන්න කියන එක තමයි එතුමා පෙන්නුම් කරලා දෙන්නේ. ඒ අපතේ යන ජලය කොතනින් හරි රැක ගන්න නම් අපිට පළාත් සභාවේ ඒ වියදම දරන්න බැරි නම් මේ යෝජනාවට රජයට හෝ යෝජනා

කරලා මේ කාර්යය අපි ඉටු කරලා දෙන්න කියමු. එතුමාට අවස්ථාව දෙමු.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka--------------------------------------------------------------------------------------

අපි ඒ අදාල ආයතන වලට යවලා ඒ අදාල ඉල්ලීම පිළිබඳව දැනුවත් කරලා ඒ වාර්තාව යවලා ඒ අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීම කරලා යවන්න කියලා මේ සභාවේ තීන්දු කරනවා.

*ගරු මන්ත්‍රී උපුල් ශ්‍යාමල් බණ්ඩාර* கௌரவ உறுப்பினர் உபுல் ஷாமல் பண்டாரHon.MemberUpulShyamalBandara -----------------------------------------

ගරු සභාපතිතුමනි මම කතා කරගෙන සිටිය නිසා මම කතාව අවසන් කළ යුතුයි. ප්‍රධාන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒවගේම අපේ විපක්ෂනායකතුමා කරපු යෝජනාව මධ්‍යම රජයට දන්වා යවන ලෙසත් ඉල්ලා සිටිනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka--------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමන්ලාට.

මේ අවස්ථාවේ අංක 15 යටතේ ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න* கௌரவ உறுப்பினர் சலீத கருணாரத்ன Hon.MemberSalithaKarunaratne ---------------------------------------------------

ගරු සභාපතිතුමනි යෝජනාවේ අවසාන වාක්‍යයේ සංශෝධනයක් පළමුව ඉදිරිපත් කරනවා.

ඒ සඳහා සබරගමුව පළාත් වෘත්තීය පුහුණු අධිකාරියක් ස්ථාපනය කොට පළාතට ගැලපෙන පාඨමාලා හඳුන්වා දී හා ඊට අදාල පෞද්ගලික ප්‍රඥප්ති ඉදිරිපත් කිරීමට අවසර දෙන ලෙස මේ ගරු සභාවට යෝජනා කර සිටිමි කියලා.

ගරු සභාපතිතුමනි සමස්ත රට තුළ මෙන්ම සබරගමු පළාත තුළද ශ්‍රම බලකාය හා සේවා වි්යුක්තිය ගැලපීමේදී තරුණ පිරිසකගේ හා උගතුන්ගේ රැකියා විරහිත බව ප්‍රතිශතාත්මකව වැඩිය. එයින් මෙරට හෝ පළාත තුළ රැකියා අවස්ථා නොමැති යැයි නොකිය යුතු වේ. ගැටළු වී ඇත්තේ තිබෙන රැකියා අවස්ථාවලට ගැලපෙන උගතුන් හා සිටින උගතුන්ට

ගැලපෙන රැකියා නොමැතිකමයි. එබැවින් අප පළාත තුළ තිබෙන රැකියා අවස්ථාවලට ගැලපෙන දැනුම,කුසලතා, ආකල්ප වලින් පිරිපුන් පිරිසක් බිහිකර ගැනීම අවශ්‍යයි.

ඒ සඳහා සබරගමු පළාත් වෘත්තීය පුහුනු අධිකාරියක් ස්ථාපනය කොට පළාතට ගැලපෙන පාඨමාලා හඳුන්වා දී ඉදිරි පියවර ගත යුතු යැයි හා ඊට අදාල පෞද්ගලික ප්‍රඥප්ති ඉදිරිපත් කිරීමට අවසර දෙන ලෙසද මේ ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි රැකියා වියුක්තිය හෙවත් රැකියා විරහිතභාවය අපේ රටේ දවසින් දවස දැවෙන වැඩි වෙන ප්‍රශ්නයක්. විශේෂයෙන් තරුණ අසහනයට තරුණයින්ගේ විරැකියා වලට එතනින් එහාට ගිහිල්ලා කැරලි කෝලාහල වලට හේතු වෙලා තියෙන්නේ

රැකියා විරහිතභාවය. ඒ හින්දා ගරු සභාපතිතුමනි රටක් විදිහට හා පළාතක් විදිහට අපේ තරුණ තරුණියන්ගේ රැකියා විරහිතභාවය පිළිබඳ බරපතල විදිහට අපි අවධානය යොමු කළ යුතු කාරණාවක්. හැබැයි මේ විදිහට තරුණ තරුණියන්ට රැකියා නැහැයි කියලා කිව්වට ඒකෙන් කොහේවත් කිය වෙන්නේ නෑ මේ රටේ හෝ අපේ පළාත තුළ රැකියා අවස්ථා නැහැයි කියන කාරණාව. අපේ උදේ ගෙදරින් එළියට බැස්සහම අපි නිතර දෙවේලේ දකිනවා කඩේ පිලේ අහල පහල තැන්වල තරුණයින් රංචු ගැසෙමින් නිකරුණේ කාලය ගත කරනවා. එහෙම නැත්නම් අර නිතර කියනවා වගේ ත්‍රීරෝද රැකියාවල වගේ අපේ තරුණයින් යෙදෙනවා. ඔවුන්ගේ නිශ්චිතව ඔවුන්ගේ අර්ථාන්විත ක්‍රියාවලියේ යෙදෙන්නේ නැතුව අපි දන්නවා අපි මහජන නියෝජිතයින් වෙන

පිරිසෙන් වැඩි පිරිසක් තරුණ තරුණියන් රැකියා ඉල්ලගෙන එන්නේ. හැබැයි ගරු සභාපතිතුමනි එක් පැත්තකින් රැකියා විරහිතභාවය බරපතල ගැටළුවක් විදිහට දවසින් දවස වැඩි වෙද්දී අනිත් පැත්තෙන් අත්‍යාවශ්‍ය කාරණා වලට අත්‍යාවශ්‍ය කර්මාන්ත වලට වැඩ කරන්න මිනිස්සු නැති කාරණාවක් තියෙනවා. මේකේ තරාතිරමක් නෙමෙයි. අද රබර් වතුවල කිරි කපන්න මිනිස්සු නෑ. තේ වතුවල දළු කඩන්න මිනිස්සු නෑ. ගොවිතැන් කරන්න කණ්ඩායම් නෑ. ඒ එක්කම ගරු සභාපතිතුමනි ඉරිදා පත්තරේක රැකියා පුරප්පාඩු කියලා බැලුවහම ප්‍රමාණ සමීක්ෂණ කාර්මික නිළධාරී කියලා ග්‍රැෆික් ඩිසයින්ලා ,ඉන්දියන් සහායක වෙබ් ,කොණ්ඩ සැකසීමේ ආදී වශයෙන් සිය දහස් ගාණක් දවසින් දවස පුරප්පාඩු ඉල්ලලා පත්තරේ දැන්වීම් එනවා. එකම දැන්වීම නැවත නැවත යෙදෙනවා. පළාතේ ගරු සභාපතිතුමනි පහුගිය දවසක කියවුණා අපේ සබරගමු පළාත තුළත් තාක්ෂණික නිළධාරීන් 100 හිඟයි. මේක බඳවා ගන්න

දැන්වීම් දැම්මට ඉල්ලන්නේ නෑ. ආවොත් එන්නේ එක්කෙනයි දෙන්නයි. ඒ කියන්නේ ගරු සභාපතිතුමනි තනතුරු තියෙනවා පුරප්පාඩු තියෙනවා ඒකට ගැලපෙන මිනිස්සු නෑ. ඒ හින්දා ගරු සභාපතිතුමනි මේ දෙක ගලප්පන්න ඕනකම තියෙනවා. මට මතක් වෙන්නේ මගේ ගුරුවරයෙක් වෙච්චි මහාචාර්ය රූපසිංහ මැතිතුමා කියපු කාරණාවක්. එතුමා ඉතා පැහැදිලිව කිව්වා මේ රටේ උගතුන්ට රැකියා නෑ. රැකියා වලට උගත්තු නෑ. මේක තමයි අර්බුදය. රැකියා තියෙනවා රැකියා වලට ගැලපෙන උගත්තු නෑ. උගත්තු ඉන්නවා උගතුන්ට හරියන රැකියා නෑ. ඒ හින්දා ගරු සභාපතිතුමනි මේක දෙක ගලපා ගන්න ඕනේ. ඉතාම පැහැදිලිවම කිව්වා ගරු සභාපතිතුමනි 2016 මහ බැංකු වාර්තා බැලුවහම මේ කියන කාරණා ඉතා පැහැදිලියි වයස්

කාණ්ඩ 15-19 තරුණ තරුණියෝ බැලුවහම 2012 දී 18.9 යි. සේවා වියුක්තිය. ප්‍රතිශතයක් විදිහට රැකියා නැති අයගේ. 2013 දී 18.9 යි. 2014 දී 21.4 යි. 2015 දී 24.1 බවට පත් වෙලා. ඒ කියන්නේ තරුණ තරුණියන්ට රැකියා නැතිකම දවසින් දවස වැඩි වෙනවා. 20-29 බැලුවහම 2012 දී 11.3 යි. 2013 දී 13.1 යි. 2014 දී 13.6 යි. 2015 දී 14.2 යි. තරුණ තරුණියන්ගේ රැකියා නැතිකම දවසින් දවස වැඩි වෙනවා. ඊළග කාරණය ගරු සභාපතිතුමනි මේකෙනුත් 6-10 සමත් අයගේ 2012 දී 3.2 යි. 2013 දී 3.4 යි. 2014 දී 3.4 යි. 2015 දී 3.4 යි. මීට වඩා වැඩිය ගරු සභාපතිතුමනි සාමාන්‍ය පෙළ පාස වෙච්චි අයගේ. 2012 දී 6% යි. 2013 දී 6% යි. 2014 දී 5.9 යි. 2015 වෙන කොට 6.4 දක්වා වැඩි වෙලා තියෙනවා සාමාන්‍ය පෙළ සමත් අයගේ. උසස් පෙළ හා ඊට එහා ගිය අයගේ කතන්දරය මීටත් වැඩිය බරපතලයි. 2012 දී 7.6 වෙච්චි එක 2013 8.8 යි. 2014 දී 8.2 යි. 2015 දී දහයකට ආසන්නයි. නමුත් 9.2 යි. මේකෙන් කියවෙන්නේ ගරු සභාපතිතුමනි තරුණ තරුණියන්ට රැකියා නෑ. ඉගෙන ගත්ත අයට රැකියා නෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි මම නැවතත් යෝජනා කරන්නේ මේක දෙක ගලපා ගන්න ඕනේ. මේ දෙක ගලපා ගැනීමේ වගකීම තියෙන්නේ අපේ අතේ. ගරු සභාපතිතුමනි 13 වෙනි සංශෝධනයේ සමගාමී ලැයිස්තුවේ තියෙනවා 21 වගන්තිය සේවා වියුක්තිය පළාත්බද මට්ටමේදී සේවා නියුක්තිය සැලසුම් කිරීම පළාතට අදාල වන විශේෂ සේවා නියුක්ති වැඩ සටහන්. පළාතට අදාල යෞවන සමාජ නියුක්ති කටයුතු සංවර්ධනය කිරීම පළාතට අදාල වෙන තාක්ෂණ මිනිස්බල සංවර්ධනය වැඩ පිළිවෙලවල්. ඒ නිසා ගරු සභාපතිතුමනි එක පැත්තකින් රැකියා නොමැතිකම මිනිස්සු ඉන්නවා. අනිත් පැත්තෙන් රැකියා තියෙනවා. මිනිස්සු නෑ. ඒ හින්දා අපේ ලොකු අර්බුදයක් තියෙනවා. මේක ගලපා ගන්න ඕනේ. ගලපා ගන්න නීතිමය ප්‍රතිපාදන අපිට තියෙනවා. ඒ හින්දා ගරු සභාපතිතුමනි මේකට ක්‍රමයක් විදිහට වඩා හොඳම දේ තමයි සබරගමු පළාත් වෘත්තීය පුහුණු අධිකාරියක් ස්ථාපනය කරනවා කියන යෝජනාව.

ගරු සභාපතිතුමනි මේකෙදී අපිට අපේ ප්‍රදේශයට අදාල වන අපේ ප්‍රදේශයේ තියෙන රැකියා පුරප්පාඩු මොනවාද කියන කාරණාව විමර්ශනය කරලා බලන්න වෙනවා. ඒකට සබරගමුව විශ්ව විද්‍යාලය වගේ තැනක් මුල් කරගෙන තවත් සමීක්ෂණයක් කරලා ගරු මහ ඇමතිතුමාගේ නීතිය හා සැලසුම් අමාත්‍යාංශයෙන් පාවිච්චි කරලා අපිට මේක සමීක්ෂණය කරන්න පුළුවන් වෙනවා. ඒ අනුව ගරු සභාපතිතුමනි තියෙන පුරප්පාඩු මොනවාද කියලා ඒකට අදාල රැකියා හදා ගන්න පුළුවන්. ඒ අනුව ගරු සභාපතිතුමනි මේ එක අමාත්‍යාංශයක් නෙමෙයි කර්මාන්ත අමාත්‍යාංශයේ වැඩි බරක් තියෙනවා මේ කාරණාවට. අනිත් පැත්තෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට ,අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු සියළු අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරලා ඒ විෂයන් වලට ගැලපෙන විදිහට මිනිස්සු හදන්න අපේ තරුණ තරුණියන්ගේ දැනුම වර්ධනය කර ගන්න මේ රක්ෂාවල් තරාතිරම නෙමෙයි තමන්ගේ සේවයේ නිපුණතාවය ඇති කර ගන්න විදිහට ගැලපෙන ආකල්ප ඇති කර ගන්න ඒ සඳහා ඔවුන්ගේ කුසලතා වර්ධනය කරන දැනුම,කුසලතා,ආකල්ප වලින් පිරිපුන් ශ්‍රම බලකායක් අපි හදා ගත්තොත් එක් පැත්තකින් රැකියා විරහිතභාවයට උත්තර හොයනවා වගේම අපේ රටේ සංවර්ධනයට පළාතේ සංවර්ධනය දවසින් දවස වැඩි කරන්න පුළුවන් වෙයි. ඒ හින්දා ගරු සභාපතිතුමනි සබරගමු

පළාත් වෘත්තිය පුහුණු අධිකාරියක් පිහිටුවන්න ස්ථාපනය කරන්න කියන යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරමින් ඒ සඳහා පෞද්ගලික ප්‍රඥප්ති ඉදිරිපත් කරන්න අවසර දෙන්න කියලා ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව මම ස්ථිර කරනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka*---------------------------------------------------------------------------------

පොඩ්ඩක් ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ගරු විපක්ෂනායකතුමා

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*** *கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச* *Hon.OppositionLeader W.Somadasa*---------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපි යෝජනාවක් ගෙනාවා. එය සාකච්ඡා නොකර මේ වගකිව යුතු තැන් වලට යවන්න කියලා. මොකද හේතුව විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වැදගත් යෝජනාවක් ගෙනාවා. ඒකට කතා කරන්න ඔබතුමාට නම් ලැයිස්තුවක් අපි දීලා තියෙනවා. ඒ අදහස් දක්වන කොටඒක නවත්තන්න කටයුතු කරනවා නම් මේවාත් නවත්තන්න ඕනේ. එහෙම නැත්නම් අපි හැම එක්කෙනෙක්ම විරුද්ධත්වය ප්‍රකාශ කරලා අපි යනවා එළියට. මෙහෙම කරන්න පුළුවන්ද. වැදගත් යෝජනාවක් මේක. මේක අනාගත පරපුර වෙනුවෙන් කරපු යෝජනාවක්. මේ යෝජනාව වැදගත් නම් මේක ඉහළට හරි යොමු කරන්න.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka*---------------------------------------------------------------------------------

නෑ ගරු විපක්ෂනායකතුමා මම මේ සම්බන්ධව පක්ෂග්‍රාහී වෙන කාරණාවක් නෙමෙයි. නමුත් ඔබතුමන්ලාට ඉදිරිපත් කළා ප්‍රධාන

ඇමතිතුමා කරුණු. එතකොට ප්‍රධාන ඇමතිතුමාගේ කරුණු වලට තමුන්නාන්සේලා ඊට අභිබවා කරුණු ඉදිරිපත් කළේ නෑ. එතනින් එහාට කතික ලැයිස්තුවේ අය කතා ඉල්ලුවේ නෑ. ඔයගොල්ලෝ එතනින් නිහඬ වුණා. ඒ නිහඬවීම තුළ තමයි මම ඊළඟ යෝජනාව ගත්තේ. එහෙම නැතුව මම මෙතන ඉඳගෙන පක්ෂග්‍රාහී වුනේ නෑ.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි මට මේ යෝජනාව ස්ථිර කරන්න අවස්ථාව දෙන්න.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்லHon.Opposition Whip SiripalaKiriella*

------------------------------------------------------

මම ස්ථිර කරලා ඊට පස්සේ උපුල් ශ්‍යාමල් බණ්ඩාර මන්ත්‍රීතුමා නැගිට්ටා. කතා කරන්න. එතන ලොකු වරදක් වුණා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.OppositionLeader W.Somadasa---*

--------------------------------------------------------

ජලය ආරක්ෂා කරන ක්‍රමයක් තමයි එතුමා යෝජනා කළේ. ඉදිරි අනාගත පරපුරට.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்லHon.Opposition Whip SiripalaKiriella*

------------------------------------------------------

යෝජනාවක් ගෙනාවහම ඒක හැල්ලුවට ලක් කරන්න එපා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*------------------------------------------------------------------------------------

විපක්ෂ සංවිධායතුමා මේක තේරුම් ගන්න. කතාව නවත්තන්න මම කටයුතු කළේ නෑ.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.MemberRamya Kumara Weerasinghe* --------------

------------------------------------------

ගරු සභාපතිතුමනි ඒ ඉල්ලීම අසාධාරණයි.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.OppositionLeader W.Somadasa---*

--------------------------------------------------------

මෙතුමා කතා කරද්දී ගරු මහ ඇමතිතුමා නැගිටලා කතා කළා. සාකච්ඡා කරන්න ඕනේ නෑ මේවා යවන්න වගකිව යුතු තැන්වලට. අපි ඒක විවාදයට ගන්නවා නම් අපි විපක්ෂයේ මන්ත්‍රීවරු විරුද්ධත්වය ප්‍රකාශ කරලා නැගිටලා යනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*---------------------------------------------------------------------------------------------

ඒ අනුව මට කටයුතු කරන්න බෑ. මමපුළුවන් වෙන්නේ න්‍යාය පත්‍රය අනුව කටයුතු කරන්න. ප්‍රධාන ඇමතිතුමා කරුණු ඉදිරිපත් කළා. කරුණු ඉදිරිපත් කළහම තමුන්නාන්සේලා නිහඬ වුණා. යෝජනාව ඉතුරු බව හැබෑව.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි රීතිය අනුව මේ ඉල්ලීම වැරදියි. යම් කතාවක් කරන කොට ඒ යෝජනාවේ ඒ අයට අවස්ථාව නොලැබෙනවා නම් මේගොල්ලන්ට තිබුණා ඒ අවස්ථාවේදී නැගිටලා මේ කියන ටික කියන්න. නැතුව දැන් කතා කරන්න බෑ. කොහේද එහෙම රීති තියෙන්නේ.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.OppositionLeader W.Somadasa*---------------------------------------------------------------

අවසානයේ ආණ්ඩු පක්ෂයේ නොසලකා හිටියා. එහෙම නෙමෙයි ප්‍රධාන ඇමතිතුමා එක පාරටම නැගිටලා විරුද්ධත්වය ප්‍රකාශ කළා. එතුමා කරපු දේ ගැන කිව්වා. ඔබතුමා කොහේද ඉන්නේ වගේ ඇහුවේ. නිදාගෙන ඉන්නවා වගේ තමයි මන්ත්‍රීතුමාට ඇගිල්ල දික් කරලා ඇහුවේ. ඊට පස්සේ මම නැගිටලා කිව්වා මේකේ පැති දෙකක් තියෙනවා. එක පැත්තක් ප්‍රධාන ඇමතිතුමා කියන දේ හරි. එතුමා සේවය කරලා තියෙනවා. ඒ නියඟයට පිළිතුරු දීලා තියෙනවා. මේක නියඟයට ඉදිරි කාලය තුළදී ජල හිඟයක් වෙන කොට මේ විදිහයි වෙන්නේ කියන එක මම පෙන්වලා මේ අයට කතා කරන්න කිව්වා. ඒක අපේ ගරු මන්ත්‍රීතුමා නැගී හිටියා. ඔබතුමා අවසානයේ තීන්දුවක් ගත්තා මගේ කතාවට අවසාන තීන්දුවක් ගත්තා මම නෙමෙයි මම පෙන්වලා දීපු මම ඉල්ලීමක් විතරයි කළේ. (ඝෝෂාව)

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*---------------------------------------------------------------------------------------------

යෝජනාව ස්ථිර වුණා.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි අවසාන කතාව තියෙන එක්කෙනා ගරු සභාපතිතුමනි කතා කළහම ඔබතුමාට හැඟී යන්නේ ඒ පැත්තේ කතා අවසානයි කියලා. ඔබතුමා මොකද පැනලා ගියේ කලින්.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.ChairmanUdayakanthaGunathilaka*----------------------------------------------------------------------------------------------

මූලාසනයේ ප්‍රශ්නයක් නෙමෙයි මේක.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க *Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ අවස්ථාව දෙන්න. මේවගේ යෝජනා ඉදිරිපත් කරන කොට පැහැදිලිව ජේනවා වැවක් හදන්න කියලා යෝජනා කරනවා මහ ඇමතිතුමාට. එවන්න තියෙන සල්ලි වලින් 32% ක් එවලා හරියට වැවක් හදන්න කියලා කෝප්පයක් පුරවන්න හදනවා පුරවන්නේ නැතුව. සභාපතිතුමා එළියට ගිහිල්ලා මොනවා හරි අරගෙන එන්න අපේ මන්ත්‍රීතුමාට. එතකොට හරියයි. ගරු සභාපතිතුමනි මෙවැනි ඉතාම අමනෝඥා යෝජනා අරගෙන ඇවිල්ලා මේ වැවක් හදන්න පුළුවන් නම්

හොඳයි. හැබැයි මහ ආණ්ඩුවෙන් වැවක් හදන්න කියලා එවපු සල්ලි සීයක් එවන්න ඕන එකෙන් 32% ක් එවලා සල්ලි නැතුව ඉන්න පළාත් සභාවට කියනවා හදන්නලු. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි ඒක තරයේ ප්‍රතික්ෂේප කරන ගමන් , සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මම මුලින්ම ස්ථිර කරනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*Hon.Opposition Whip SiripalaKiriella* -----------------------------------------------------

ගණපූරණය නෑ ගරු සභාපතිතුමා.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க *Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

මේ යෝජනාව ස්ථිර කරන ගමන්

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*Hon.Opposition Whip SiripalaKiriella* -----------------------------------------------------

ඔබතුමා ස්ථිර කළාට වැඩක් වෙන්නේ නෑ ගණපූරණය නෑ.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.ChairmanUdayakanthaGunathilaka*----------------------------------------------------------------------------------------------

මේ සභාව විනාඩි දහයකට කල් තියනවා.

නැවත සභාව ආරම්භ කරමින් ගරු උපසභාපතිතුමා මූලාසනය ගනී.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*-----------------------------------------------------------------------------------------------

ගණපූරණය නැති නිසා නැවත වතාවක් සීනුව නාද කරන්න.

සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා. கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார Hon. Minister RanjithBandara* ------------------------------------------------------

මෙම ගරු සභාව 2017.02.07 දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙසට යෝජනා කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*-----------------------------------------------------------------------------------------------

ස්තූතියි. මෙම ගරු සභාව 2017.02.07 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

උදයකාන්ත ගුණතිලක,
නියෝජ්‍ය සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017.01.31 වෙනි දින,සභා ලේකම් කාර්යාලයේ දීය.